## ගම්පොල නගර සභාව
## මහනුවර දිස්ත්‍රික්කය

-------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන.**

-----------------

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.**

--------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 19 දින ද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 09 දින ද සභාවේ, සභාපතිවරයාට යවා ඇත.

**1.2 මතය.**

------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති වැදගත් කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මට නොහැකි විය. ඒ හේතු කොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

-------------------------------------

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.**

---------------------

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සභාව සතු ඉඩම් 154 ක සහ ගොඩනැගිලි 201 ක වටිනාකම් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දී, සිංහාපිටිය හා කීරපනේ බහුකාර්යය ගොඩනැගිලි 02 ක විදුලි සම්බන්ධතා ලබා ගැනීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලයට

ගෙවූ රු.35,000 ක වටිනාකම ප්‍රාග්ධන වියදමක් ලෙස ගිණුම්ගත කළයුතු වුව ද, පුනරාවර්තන වැයක් ලෙස වැය විෂයය 34453 ට හර කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ පුස්තකාල පොත් මිල දී ගැනීමේ දී රු.26,579 ක ලැබූ වට්ටම් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) මහජන බැංකුවේ අංක 535 දරන ජංගම ගිණුමේ සත්‍ය ලෙස ශේෂයක් නොපැවති නමුත්, රු.9,500 ක අයිරාවක් ගිණුමෙහි දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ ලද රු.49,882,781 ක වැටුප් ප්‍රතිපූර්ණ ඒ ඒ ආදායම් ශීර්ෂ සඳහා බෙදා වෙන් නොකර පරිපාලන හා කාර්ය මණ්ඩල සේවා යටතේ දක්වා තිබුණි.

(ඊ) 1972 අංක 07 දරන ගෙවල් කුළී පනත යටතේ කුළී නිවැසියන් විසින් සභාව වෙත සමාලෝචිත වර්ෂයේ තැන්පත් කරන ලද ගෙවල් කුළී තැන්පතු රු.21,782 ක්, ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(උ) ලංකා බැංකුවේ අංක 2499454 දරන ජංගම ගිණුමේ ශේෂය රු.22,721 ක් වූ අතර, එය රු.69,938 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන්, රු.47,217 ක් වැඩිපුර දක්වා තිබුණි.

1.3.2 නොසැසඳු පාලන ගිණුම්.

------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සේවක ණය පාලන ගිණුමට අනුව, ශේෂය රු.13,055,917 ක් වූ අතර, උපලේඛනය අනුව ශේෂය රු.10,457,680 ක් වුයෙන්, රු.2,598,237 ක වෙනසක් නිරීක්ෂණය වුණි.

**1.3.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්.**

**---------------------------------**

**(අ) ලැබියයුතු ගිණුම්.**

**--------------------**

**2013 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂවල එකතු වටිනාකම රු.35,282,851 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.18,802,406 ක් විය.**

**(ආ) ගෙවියයුතු ගිණුම්.**

**-------------------------**

**2013 දෙසැම්බර් 31 දිනට එකතුව රු.23,713,003 ක් වූ ගෙවියයුතු ගිණුම් ශේෂවල වටිනාකමින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතු වටිනාකම රු.13,916,755 ක් විය.**

**1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

**---------------------------------**

**අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.44,782,262 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.**

**2. මූල්‍ය සමාලෝචනය.**

**----------------------**

**2.1 මූල්‍ය ප්‍රතිඵල.**

**----------------**

**ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.19,207,539 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම**

**රු.15,822,895 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලවල රු.3,384,644 ක වර්ධනයක් දක්නට ලැබුණි.**

**2.2 විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂයේ වැටුප් ප්‍රතිපූර්ණ වශයෙන් රු.49,909,360 ක් ලැබී තිබුණු නමුත්, වැටුප් හා දීමනා ලෙස රු.64,851,413 ක් ගෙවා තිබුණි. ඒ අනුව, සභාවේ ආදායමෙන් රු.14,942,053 ක මුදලක් සභා සේවකයින් සදහා වැටුප් ගෙවීමට වැය කරන බව නිරික්ෂණය වන අතර, එම මුදල් වැටුප් ප්‍රතිපූර්ණය හැර සභාවේ පුනරාවර්තන ආදායමින් සියයට 23 ක් ගෙන තිබුණි.**

**2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය.**

**----------------------------------**

**මුලු ජංගම වත්කම් සමග ජංගම වගකීම් දැක්වෙන අනුපාතය 4:1 වු අතර, ඉකුත් වර්ෂයේ අනුපාතය වු 3.9:1 මට්ටමක පවතින බව නිරීක්ෂණය වුණි. සමස්ත ජංගම වත්කම්වලින් සියයට 87 ක් හෙවත්, රුපියල් මිලියන 117 ක් අය කර ගත හැකි උපයෝගීතා සේවා හා ආදායම් ණයගැතියෝ වු අතර, මුලු ජංගම වගකීම්වලින් සියයට 70.8 ක් හෙවත්, රුපියල් මිලියන 24 ක් වියදම් ණයහිමියන්ගෙන් සමන්විත වී තිබුණි.**

**2.4 ආදායම් පරිපාලනය.**

**---------------------**

**(අ) වරිපනම් බදු.**

**--------------**

**සමාලෝචිත වර්ෂය ආරම්භයේ දි රු.29,121,425 ක හිග ශේෂයක් පැවති අතර, වර්ෂයේ බිල් කිරීම් රු.31,298,641 ක් විය. වර්ෂයේ අය කිරීම් ප්‍රතිශතය සියයට 50.8 ක් වුයෙන්, 2013 දෙසැම්බර් 31 දිනට රු.35,703,700 ක ශේෂයක් හිගව පැවතුණු අතර, 2014 ජූලි 31 දිනට රු.25,460 ක් තවදුරටත් හිගව පැවතුණි.**

(ආ) බදු කුළී.

------------

**2013 දෙසැම්බර් 31 දිනට රු.1,628,401 ක හිග ශේෂයක් පැවතුණු අතර, 2014 ජූලි 31 දිනට රු.168,636 ක් තවදුරටත් හිගව පැවතුණි.**

(ඇ) උසාවි දඩ.

-----------

**පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.379,415 ක් වූ අතර, 2014 සැප්තැම්බර් 17 දිනට රු.50,000 ක් තවදුරටත් හිගව පැවතුණි.**

3. මෙහෙයුම් සමාලෝචනය.

--------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.

---------------------------------

**ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 316 – 319 ප්‍රකාරව මුදල් හා සමාන වටිනාකමක් ඇති උප පත්‍රිකා පොත් භාරය හා සටහන් තබා ගැනීම මාණ්ඩලික තත්ත්වයේ නිලධාරියෙක් භාරයේ පැවතියයුතු වුවත්, සභාවේ ආදායම් අංශයේ කම්කරු සේවිකාවක් වෙත උප පත්‍රිකා පොත් භාරය පවරා තිබුණි. පරීක්ෂණ දිනය වූ 2013 දෙසැම්බර් 19 දිනට පැවති පොත් ශේෂය 3057 කි.**

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

**--------------------------**

**2011 වසරේ ලබා දුන් රු.35,000 ක් හා 2012 වසරේ දි ලබා දුන් රු.100,000 ක් වශයෙන් එකතුව රු.135,000 ක් අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.**

**3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

**-----------------------------------**

**සමාලෝචිත වර්ෂය අවසානයට රු.167,950 ක් වටිනා වත්කම් වර්ග 02 ක් අවුරුදු 02 කට වැඩි කාල සීමාවක සිට නිෂ්ක්‍රීයව හා ඌණ උපයෝජිතව පැවතින.**

**3.4 ඝන අපද්‍රව්‍ය කළමනාකරණය.**

**------------------------------**

**ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් ක්‍රියාත්මක නොකර, දෛනිකව එකතු කරන කසළ පස් දමා වැළලීම සිදු කිරීම සඳහා බැකෝ යන්ත්‍රයක් කුළී පදනම මත ලබා ගෙන, සමාලෝචිත වර්ෂයේ දි, රු.1,399,657 ක වියදමක් දරා තිබුණි. මේ අනුව, බැකෝ ලෝඩර් යන්ත්‍රයක් මිලට ගැනීමට කටයුතු නොකර, කසළ කළමනාකරණය හා වෙනත් කාර්යයන් සඳහා බාහිර ආයතනවලින් බැකෝ යන්ත්‍ර කුළියට ගැනීම සඳහා 2013 වර්ෂය තුළ රු.1,399,657 ක මුදලක් සභා අරමුදලින් වැය කර තිබුණි.**

**3.5 පාරිසරික ගැටළු.**

**-----------------**

**1988 අංක 56 සහ 2000 අංක 53 සහ දරණ පනත්වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූලව 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරණ අති විශේෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශිත ව්‍යාපෘති සඳහා පරිසර බලපත්‍ර ලබා ගතයුතු බවට**

අවධාරණය කර තිබුණි. මෙම නියමයට පටහැනිව පරිසර බලපත්‍ර ලබා නොගෙන, පවත්වා ගෙන යන අවස්ථා 37 ක් නියැදි පරීක්ෂාවේ දි නිරීක්ෂණය වූ අතර, එම හේතුවෙන්, සභාවට රු.270,000 ක මුදලක් අහිමි වී තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය.**

**4.1 සංයුක්ත සැළැස්ම.**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ සංයුක්ත සැළැස්මක් පිළියෙළ කර නොතිබුණි.

**4.2 ප්‍රසම්පාදන සැළැස්ම.**

රු. මිලියන 112 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.3 ක්‍රියාකාරී සැළැස්ම.**

සභාව විසින් සමාලෝචිත වර්ෂයේ දි ක්‍රියාකාරී සැළැස්මක් සකස් කර නොතිබුණි.

**4.4 විගණන හා කළමනාකරණ කමිටු.**

සභාවේ සමාලෝචිත වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**4.5 අභ්‍යන්තර විගණනය.**

සමාලෝචිත වර්ෂයේ දි සභාවේ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

**4.6** **අයවැය පාලනය.**

**------------------**

**(අ)** **සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙළ කර තිබුණු අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේ දී, ආදායම් විෂයයන් 07 කට සියයට 03 සිට සියයට 92 දක්වා ද, වියදම් විෂයයන් 08 ක සියයට 27 සිට සියයට 86 දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.**

**(ආ)** **ආදායම් ශීර්ෂ 04 ක් සඳහා අයවැයගත රු.176,343,698 ක් වූ ආදායම් උපයා ගැනීමට සමත් වී නොතිබුණි.**

**5.** **පද්ධති හා පාලන.**

**--------------------**

**පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.**

**(අ)** **අයවැය පාලනය**

**(ආ)** **ආදායම් පරිපාලනය**

**(ඇ)** **වත්කම් කළමනාකරණය**